ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංග කලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU5512- අධ්‍යාපනයේ පදනම**
කාලය පැය තුනයි (03)

---

දිනය - 2024.12.16 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. පුද්ගල දෘෂ්ටිකෝණයට අනුව අධ්‍යාපනයේ කාර්යයන් තුනක් (03) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

02. මොන්ටිසෝරි අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ පහක් (05) නම් කරන්න.

03. "ආකල්ප" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

04. "සමාජ සචලනය" යන සංකල්පය සුදුසු උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. "වැඩිහිටි අධ්‍යාපනය" සමාජයට අවශ්‍ය වීමට හේතු පහක් (05) දක්වන්න.

06. විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය අතර වෙනස්කම් හතරක් (04) කෙටියෙන් විස්තර කරන්න.

07. විවෘත හා දුරස්ථ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග පහක් (05) සඳහන් කරන්න.

08. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ තරඟකාරීත්වයයි. මෙම ගැටලුව අවම කිරීම සඳහා සුදුසු යෝජනා පහක් (05) ලබා දෙන්න.

(ලකුණු 05x08=40)

## 02 වන කොටස

09. (i.) බොම්රින් ( Baumrind) විසින් හඳුනාගත් දෙමාපිය විලාස තුන (03) නම් කරන්න.

(ලකුණු 03)

(ii.) "ළමයා සමාජානුයෝජනය කිරීමේ දී පවුල ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු හතරක් (04) සපයන්න.

(ලකුණු 08)

(iii.) පාසල තුළ ශිෂ්‍යයාගේ සමාජානුයෝජනය ඉහළ නැංවීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි පියවර තුනක් **(03)** අගයන්න. (ලකුණු 09)

10. (i.) මහත්මා ගාන්ධි තුමා විසින් හඳුන්වා දුන් "නයි තාලිම්" හි මූලධර්ම තුන **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii.) ගාන්ධිතුමා විසින් යෝජනා කරන ලද ශිල්ප කේන්ද්‍රීය අධ්‍යාපනයේ ධනාත්මක බලපෑම් හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ගාන්ධිතුමා අවධාරණය කළේ දරුවාගේ ශරීරයේ (හිස,අත,හදවත) යන අංශ තුනෙහිම එකමුතු සංවර්ධනයක් ඇති කිරීම සඳහා අධ්‍යාපනය ලබාදිය යුතු බවයි. ශිෂ්‍යයෙකුගේ ආවේදන ක්ෂේත්‍රය (හදවත) සංවර්ධනය කිරීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී (නාට්‍ය හා රංගකලා / විද්‍යා/ගණිතය විෂයය) සඳහා යොදාගත හැකි ඉගැන්වීම් ක්‍රම තුනක් **(03)** නම්කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

11. (i.) "සමාජ ස්ථරායනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) "ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සිසුන්ට සමාජ සචලනය ළඟා කර ගැනීමට උපකාර කරයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? හේතු හතරක් **(04)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) පහළ සමාජ ආර්ථික පසුබිමක් සහිත දරුවන් මුහුණදෙන අධ්‍යාපනික ගැටලු තුනක් **(03)** සඳහන් කර එම ගැටලු අවම කිරීම සඳහා පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i.) අධ්‍යාපනික පරමාර්ථ සහ අධ්‍යාපනික අරමුණු අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) රටක අධ්‍යාපන ක්‍රමය තුළ අධ්‍යාපන පරමාර්ථ සහ අරමුණු ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයට හේතු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii.) වර්තමාන ශ්‍රී ලංකාවට යෝග්‍ය අධ්‍යාපන පරමාර්ථ දෙකක් **(02)** දක්වා එම පරමාර්ථ ඔබ තෝරා ගැනීමට හේතු දක්වන්න (ලකුණු 08)

13. (i.) නොවිධිමත් අධ්‍යාපනය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii.) පුද්ගලයන්ගේ සමාජ කුසලතා සංවර්ධනය සඳහා අවිධිමත් අධ්‍යාපනය වැදගත් වීමට හේතු දෙකක් **(02)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) සිසුන්ට යාවජීව ඉගෙනුම්ලාභීන් වීමට උපකාර කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට භාවිත කළ හැකි උපායමාර්ග හතරක් **(04)** නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- සියලුම හිමිකම් ඇවිරිණි. -